# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2307/43 – 2022 නොවැම්බර් 24 වැනි බ්‍රහස්පතින්දා – 2022.11.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 34 මත්තක ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මත්තක ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක GA/NYG/2020/785 හා 2021.01.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අංක **‘A’** – **හාතවිල කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0549**

උතුරට: එම්. ඊ. කුලරත්න, කපිල සේනාධිරත්න, එච්. ඩබ්. නිශාන්ත සහ තවත් අය හිමිකම් කියන හාතවිල කුඹුර සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ කේ. ඒ. සෝමවතී හිමිකම් කියන හාතවිල නින්දමුල්ල කුඹුර; දකුණට: කේ. ඒ. සෝමවතී හිමිකම් කියන හාතවිල නින්දමුල්ල කුඹුර සහ එම්. ඊ. කුලරත්න, කපිල සේනාධිරත්න, එච්. ඩබ්. නිශාන්ත සහ තවත් අය හිමිකම් කියන හාතවිල කුඹුර; බටහිරට: එම්. ඊ. කුලරත්න, කපිල සේනාධිරත්න, එච්. ඩබ්. නිශාන්ත සහ තවත් අය හිමිකම් කියන හාතවිල කුඹුර.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2020/CEB/05.
2022 ඔක්තෝබර් මස 05 වැනි දින.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 11 – 0287